# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය

### නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2022

### පොදු අන්තර්ජාතික නීතිය
(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. 'ජාත්‍යන්තර සබඳතා පද්ධතියකට වඩා ලෝකයේ නිසි පාලනයක් ඇති කිරීමට අන්තර්ජාතික නීතිය අවශ්‍ය වේ. එබැවින්, සමකාලීන අන්තර්ජාතික නීතිමය විධානය (Legal Order) සහ පද්ධතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා අවබෝධයක් සඳහා ඓතිහාසික ප්‍රවේශයකින් තත්කාලීන අන්තර්ජාතික නීතිය අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ.'

   අන්තර්ජාතික නීතියේ පරිණාමය සහ තත්කාලීන තත්ත්වය විදහා දක්වන අදාළ උදාහරණ ගෙනහැර දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

   (ලකුණු 100)

2. සෙන්ඩිබ් රජය ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින අතර එහි ප්‍රතිඵලයක් ලෙස සිවිල් කැලඹීම් රැසක් ඇති වේ. රටේ විපක්ෂය වන 'වෝරා වෝරා' විරෝධතාවක් සංවිධානය කරයි. විරෝධතාකරුවන් සෙන්ඩිබ් හි පිහිටි රාස්ට්‍රා රාජ්‍යයට අයත් කම්හලක් ගිනිබත් කරන අතර එම ස්ථානයේ සිටි රාස්ට්‍රා ජාතිකයන් තිදෙනෙක් මරණයට පත් වෙති. ක්වාලුහි ජාතික රූපවාහිනියේ මාධ්‍ය වාර්තාකරුවෙකු ලෙස සේවය කරන ක්වාලු ජාතික රොස්තොව් සෙන්ඩිබ්හි පොලිස් නිලධාරීන් විසින් බලහත්කාරයෙන් අත්අඩංගුවට ගනු ලැබේ. ඔහු 'වෝරා වෝරා' වෙනුවෙන් ක්‍රියා කරන ඔත්තුකරුවකු යන පදනම මත ඔහුට දරුණු ලෙස පහර දෙනු ලැබේ. රාස්ට්‍රා රාජ්‍ය කියා සිටින්නේ සිය ජාතිකයන්ගේ මරණ සහ සිය දේපළ විනාශ කිරීම සම්බන්ධයෙන් සෙන්ඩිබ් වගකිව යුතු බවයි. ක්වාලු රාජ්‍යය කියා සිටින්නේ රොස්තොව්ට වධහිංසා පැමිණවීමට සෙන්ඩිබ් වගකිව යුතු බවයි. සෙන්ඩිබ් රජය කියා සිටින්නේ කම්හල ගිනිබත් කිරීම සහ එම නිසා සිදුවූ මරණ සම්බන්ධයෙන් කිසිදු

සම්බන්දයක් නොමැති බවයි. සෙන්ඩිබ් රාජ්‍ය රොස්තොව්ට කිසිදු හානියක් කිරීමට අණ නොකළද ඔහුගේ සජීවී ආවරණය රටට අපකීර්තියක් ගෙන දුන් බැවින් රොස්තොව්ව අත්අඩංගුවට ගත් බව සෙන්ඩිබ් රාජ්‍ය කියා සිටී.

අන්තර්ජාතික නීතිය යටතේ සෙන්ඩිබ් රාජ්‍යයෙහි වගකීම සහ එකී වගකීම අවම කිරීම සඳහා කරන ඉල්ලීම්වල වලංගුභාවය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 100)

3. අ හා ආ යන කොටස් දෙකටම පිළිතුරු සපයන්න

(අ) 'සිය භෞමික සීමාව තුළ පැන නගින සියලුම සිවිල් සහ අපරාධ කාරණා සම්බන්ධයෙන් සියලුම ස්වෛරී ස්වාධීන රාජ්‍යයන්හට එකී භෞමික සීමාවන් තුළ ඇති සියලුම පුද්ගලයින් සහ දේපළ පිළිබඳ අධිකරණ බලය සතු වීම ස්වෛරීභාවයේ (Sovereignty) අත්‍යවශ්‍ය ගුණාංගයකි.'

රාජ්‍යයක සිය භෞමික ප්‍රදේශයෙන් පිටස්තරව  අධිකරණ බලය ක්‍රියාත්මක කළ හැකි පදනමක්  පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්  ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 50)

(ආ) ස්වේචා රාජ්‍යයේ පුරවැසියන් වන ඇලන් සහ බරනන්, ස්වේචා රාජ්‍යයේ පිහිටි රන්තානියා රාජ්‍ය නියෝජනය කරන තානාපති කාර්යාලයේ ප්‍රාදේශීය කටයුතු සඳහා දේශපාලන නිලධාරියා ලෙසත්, අරක්කැමියා ලෙසත් පිළිවෙලින් සේවයේ යොදවා ඇත. ස්වේච්චන් බලධාරීන් ඇලන් සහ බරනන් අත්අඩංගුවට ගෙන මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් ඔවුන්ට චෝදනා කරති. ස්වෙච්චා නීතිය යටතේ තහනම් ද්‍රව්‍යයක් වන මත්ද්‍රව්‍යය  ස්වේචා වෙත ආනයනය කිරීමට ඇලන් රන්තානියා රාජ්‍යයේ රාජ්‍ය තාන්ත්‍රික බෑගය  භාවිතා කර ඇති බවත් බරනන් මේවා දේශීය මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට බෙදා හරින බවත් ඔවුහු පවසති. එකී සිදුවීම දැනගත් වහාම  රන්තානියා රාජ්‍යයේ  තානාපතිවරයා ඇලන් සහ බරනන්ගේ සේවය අවසන් කිරීමට අදහස් කරන බව නිවේදනය කරයි.

(අ.පි.බ.)

රන්තානියා සහ ස්වේවා යන රාජ්‍යයන් 1961 තානාපති සබඳතා පිළිබඳ වියානා සම්මුතියේ පාර්ශවකාර රාජ්‍යයන් යැයි උපකල්පනය කරන්න. පහත කරුණු සම්බන්ධයෙන් ඇලන් සහ බරනන් හට උපදෙස් දෙන්න.

I) ඔවුන්ට එරෙහි අපරාධ චෝදනා සඳහා මුක්තිය ලැබීමට ඔවුන්ට අයිතියක් තිබේද යන්න.
II) ඇලන් සහ බරනන් රන්තානියා පුරවැසියන් වූවා නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේද ?

(ලකුණු 50)

4. සීතාලන්ඩ් රාජ්‍යට යාබද ප්‍රදේශයක් වන 'මධුරාභූමි' ප්‍රදේශයේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදය සහ තරඟකාරී වෙළඳපොළක් සඳහා ප්‍රතිපාදන සලසන තමා විසින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යැයි සඳහන් කරන නීතිමය ලියවිල්ලක් සම්මත කර ගෙන ඇත. කෙසේ වෙතත්, ආරක්ෂක කවුන්සිලයේ සාමාජිකයෙකු වන සීතාලන්ඩ් කියා සිටින්නේ මධුරාභූමි ප්‍රදේශය ඓතිහාසික වශයෙන් ඔවුන්ගේ ප්‍රදේශවලින් එකක් බවත් ඔවුන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ සඳහා සාක්ෂි සපයන බවත්ය. මධුරාභූමි සහ සීතාලන්ඩ් අතර දේශපාලන ගැටුම් උත්සන්න වන විට, මධුරාභූමි ප්‍රදේශය සිය ස්වාධීනත්වය ප්‍රකාශ කර එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය සඳහා අයදුම් කරයි. මධුරාභූමි පිළිගැනීමට සීතාලන්ඩ් විරුද්ධ වේ. නමුත් රාජ්‍යයන් කිහිපයක් මධුරාභූමිහි ස්වාධිනත්ව ප්‍රකාශය පිළිගැනීමට කැමැත්තෙන් සිටී. 'ගෝලීය පුරවැසියන්,' නම් අන්තර්ජාතික සංවිධානයක් පවසන්නේ මධුරාභූමි රාජ්‍යයක් ලෙස පිළි නොගත යුතු බවත් එයට හේතුව නම් එහි දේශසීමා තුළ ළමා ශ්‍රමය සූරාකෑම සහ නියාමනය නොකළ විමෝචනවලින් සාගර දූෂණය සිදු කිරීමයි.

ඔබ අන්තර්ජාතික නීති කොමිසමේ උපදේශකයෙකු යැයි සිතන්න. ඉහත ගැටලුවට සම්බන්ධ පාර්ශවයන්ගේ තත්වය, අයිතිවාසිකම් සහ යුතුකම් විශ්ලේෂණය කරමින් කොමිසමට වාර්තාවක් සකස් කරන්න.

(ලකුණු 100)

5. 'අන්තර්ජාතික නීතියේ ඇති මූලාශ්‍ර, බන්ධනාත්මක රීතීන් (binding rules) ලෙස නොව සන්දර්භීය මූලධර්ම (contextual principles) ලෙස ගෙන මෙම සියවසේ අන්තර්ජාතික නීතියේ මූලධර්ම ලොව පුරා යථාර්ථයක් බවට පත් කිරීමේ දී දේශීය අධිකරණවල විනිසුරුවරුන් වැදගත් කාර්යභාරයක් භාර ගෙන ඇත'.

M. Kirby, 'International Law-The Impact on National Constitutions' (2006) AUILR 327, 329.

(අ.පි.බ.)

ශ්‍රී ලංකාව සහ ඔබ කැමති වෙනත් ඕනෑම තෝරාගත් අධිකරණ බල ප්‍රදේශයක් ආශ්‍රයෙන් අන්තර්ජාතික නීතිය දේශීයව ක්‍රියාත්මක කිරීමේදී අධිකරණය විසින් ඉටු කරන ලද කාර්යභාරය සම්බන්ධයෙන් විවේචනාත්මකව විශ්ලේෂණයක් ඉහත උපුටා දැක්වීම ඇසුරෙන් සිදු කරන්න.

(ලකුණු 100)

6. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් වන ඔරිස්සා සහ අක්‍රේන රාජ්‍යයෝ දේශ සීමාවක් බෙදා ගනිති. ගොන්ස්ටෙක් ප්‍රදේශය පිහිටා ඇත්තේ අක්‍රේන දේශසීමාව ආසන්නයේ ඔරිස්සාට ආසන්නව වන අතර එහි පුරවැසියන්ගෙන් බහුතරයක් ඔරිස්සන් සම්භවයක් ඇති අය වේ. දශක ගණනාවක් තිස්සේ ඔරිස්සා ගොන්ස්ටෙක් ප්‍රදේශය තම භූමියට ඈඳා ගැනීමට උත්සාහ කළ නමුත් එය අසාර්ථක විය. 2022 දී ඔරිස්සා විසින් ගොන්ස්ටෙක් ප්‍රදේශය ඔරිස්සා වෙත ඈඳා ගැනීමට සහාය දක්වන ගොන්ස්ටෙක් කලාපයේ ක්‍රියාත්මක වන උපහමුදා කණ්ඩායමක් වන 'අසුරීස්' වෙත ආයුධ, සංවිධාන ශක්තිය සහ මුදල් ආධාර සපයයි. අක්‍රේනයේ කටයුතු කරන ඔරිස් විරෝධී කණ්ඩායමක් ඔරිස්සාහි සන්නද්ධ ප්‍රහාරයක් එල්ල කර ඔරිස්සාහි අගනුවර වන ලොගුන්ඩිහි හමුදා බංකරයක් විනාශ කරයි. ඔරිස්සා සිය සන්නද්ධ හමුදා නවීන කාලතුවක්කු වලින් සන්නද්ධව අක්‍රේනයේ දේශසීමා අසලට යවා අක්‍රේනය ආක්‍රමණය කරයි. ඔරිස්සා තර්ක කරන්නේ තමා අක්‍රේනයේ බලයේ සිටි ආණ්ඩු විසින් අඛණ්ඩව පීඩාවට පත් කළ අක්‍රේනයේ පුරවැසියන්ට උපකාර කිරීම සඳහා මානුෂීය මෙහෙයුමක් සිදු කරන බවයි. ඔරිස්සා සහ අක්‍රේනයේ හමුදා අතර දරුණු සටන් ඇති වේ. ප්‍රකාශය කරන අවස්ථාවේ ඔරිස්සා සතුව එවැනි අවි නොතිබුණද, අක්‍රේනය පරාජය කිරීමට න්‍යෂ්ටික අවි භාවිත කිරීමට ඔරිස්සා පසුබට නොවන බව ඔරිස්සා ජනාධිපතිවරයා ප්‍රකාශ කරයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට යැවීමට නියමිත වාර්තාවක් සකස් කිරීමට ඔබ නීති උපදේශකයෙකු ලෙස පත් කර ඇතැයි සිතන්න. ඔරිස්සා සහ අක්‍රේනයේ ක්‍රියාවන්හි නීත්‍යානුකූලභාවය විවේචනාත්මකව තක්සේරු කරමින් වාර්තාව සකස් කරන්න.

(ලකුණු 100)